ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-09.20 |

පැමිණිලිකරු : ඒ.ඒ. චමින්ද අතාවුද මයා.
අංක 95/8, නව නගර පාර,
බැලුම්මහර.

වගඋත්තරකරුවන් : ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
අංක 42, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

**පැමිණිලි අංක : HRC/685/16/I-23**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, අතහැර දැමූ කුඹුරු ඉඩමක් වූ පුස්වල කුඹුරෙහි ගොඩනැගිල්ලක් තැනීමට වගඋත්තර පාර්ශවය වෙතින් ඉල්ලීම් කළ බවත්, ඒ අනුව 2015.01.28 දින අවසර ලබා දී 2015.03.11 දින එය අවලංගු කළ බවත්, නැවත තමා 2015.05.05 දින අභියාචනා කිරීමෙන් පසු නැවත 2015.08.12 දින අවසර පත්‍රය බලාත්මක කළ බවත්, තමා ඒ අනුව ලක්ෂ 20කට අධික මුදලක් වැය කර ඉදිකිරීම් කළ පසු නැවත 2015.09.16 දින තාවකාලිකව එය අත්හිටුවන ලද බවත්ය.

පසුව නැවත 2015.11.04 දින ඉදිකිරීම් කරගෙන යාමට අවසර ලබා දුන්නද, එයද තාවකාලිකව අත්හිටුවා ඇති බවත් තමා නිසි ආකාරයට ඉල්ලුම් කර තිබියදී අවසරය ලබා දී පනත ප්‍රකාරව දක්වා නැති මහජන විරෝධතා හා දේශපාලන බලපෑම මත එම අවසරය අවලංගු කිරීම නිසා තමාට නීතියේ රැකවරණය සර්වසාධාරණව නොලැබුණු බව දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු විසින් ඔහුට හිමි කුඹුරු ඉඩමක කණු මත නිවසක් ඉදිකිරීම සඳහා ඉල්ලීමක් කල බවත්, ඒ අනුව තමා ගම්පහ දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙතින්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர்: 011-2689558
ඡායා… / காரிக அமைப்பு: 011-2689558,
වෙබ්

වාර්තාවක් කැඳවූ බවත්, එම වාර්තාවට අනුව ඉඩම තුළ අදාළ කාර්යය ඉටු කිරීම සඳහා අනුමැතිය ලබා දුනහොත් පාරිසරික හා සාමාජීය ගැටළු ඇතිවිය හැකි බව දක්වා තිබුණු බවත්ය.

මේ පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලබාගත් වාර්තාවට අනුව, මෙම ඉඩම තුළ කණු මත ඉදිකිරීමක් කළහොත් පාරිසරික ගැටළු ඇති නොවන අතර, ගම්වාසීන් මේ පිළිබඳ විරුද්ධත්වය ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු සමඟ වූ පෞද්ගලික ආරවුලක් මත බවට නිරීක්ෂණය වූ බවත්, තමාට මේ සම්බන්ධව විරෝධතා ලිපි ඉදිරිපත් වුවද අයදුම්කරුගේ අසරණභාවය සලකා බලා තමා විසින් 2015.01.28 දාතමින් කණු මත නිවස ඉදිකිරීමට අනුමැතිය දුන් බවත් සඳහන් කර ඇත.

පසුව 2015.03.11 දින ප්‍රබල විරෝධතාවයක් එල්ලවීම හේතුවෙන් බලපත්‍රය අවලංගු කිරීමට සිදු වූ බවත්, අයදුම්කරුගේ අභියාචනය සලකා බලා ත්‍රිපුද්ගල කමිටුවක් මගින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලබා ගත් නිරීක්ෂණ හා නිර්දේශ මත පදනම්ව අවලංගු කළ බලපත්‍රය 2015.08.12 දිනැති ලිපියෙන් බලාත්මක කළ බවත් සඳහන් කර ඇත.

නැවත සංවර්ධන කටයුතු ආරම්භ කළ පසු ඇති වූ විරෝධතා හේතුකොටගෙන 2015.09.16 දිනැති ලිපියෙන් නැවත අවසරය අවලංගු කිරීමට සිදු වූ බවත්, ප්‍රදේශයේ මහජනතාවගේ, ගොවි ජනතාවගේ, රාජ්‍ය නිලධාරීන්ගේ හා දේශපාලන අධිකාරියේ බලවත් විරෝධතාවය හේතුවෙන් මෙම බලපත්‍රය අවලංගු කළ බවත්, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් අවසන් තීරණයකට එළඹීම සුදුසු බවට තමා අපේක්ෂා කරන බවත් වගඋත්තරකරු විසින් වැඩිදුරටත් දන්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය :-**

පැමිණිලි පාර්ශවය විසින් මූලිකව කොමිෂන් සභාවේ අවධානය යොමු කරනු ලබනුයේ නීතියේ රැකවරණය තමාට සර්ව සාධාරණව නොලැබුණු බවයි.

එහිදී පැමිණිලිකාර පාර්ශවය දක්වා ඇත්තේ කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට අනුමැතිය ඉල්ලූ බවත්, වගඋත්තර පාර්ශවය අදාළ අනුමැතිය ලබාදීමෙන් සුජාත බලාපොරොත්තුවක් (legitimate expectation) ඇති කළ බවත් කිපවිටක් එම බලපත්‍රය අවලංගු කළ බවත්, නමුත් විටින් විට එම බලපත්‍රය නැවත නැවත ලබාදීමෙන් තමාට legitimate expectation ලබාදීම තුළින් තමා ඉදිකිරීම් කිරීමත් එමනිසා විශාල මුදලක් වැය වීමක් වූ බවත්ය.

එසේම, පනත ප්‍රකාරව එම අනුමැතිය ලබාගැනීමට අදාල සියලු කාර්යයන් සපුරා තිබියදීත් අවලංගු කිරීම පිළිබඳ දක්වා ඇති ප්‍රතිපාදන නොසලකා එම අවසරය අවලංගු කිරීමෙන් තමාට නීතියේ රැකවරණය සර්වසාධාරණව නොලැබුණු බවද දක්වා ඇත.

ඒ අනුව වගඋත්තර පාර්ශවය 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අනුව පැමිණිලිකරු ඉදිකිරීමකට අවසර ඉල්ලීම අනුව කොන්දේසි සහිතව අවසර ලබා දුන් නමුත්, ලැබුණු විරෝධතා අනුව එම බලපත්‍රය කිපවිටක් අවලංගු කළ බවත් නැවත පරීක්ෂණවලින් පසු නැවත අනුමැතිය දුන් බවත් නමුත් මහජනතාවගේ, ගොවි ජනතාවගේ, රාජ්‍ය නිලධාරීන්ගේ හා දේශපාලන අධිකාරියේ විරෝධතාවය මත අවසානයේදී එය අවලංගු කළ බවත් දක්වා ඇත.

ඒ අනුව වගඋත්තර පාර්ශවය 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 34 (1) අනුව කුඹුරු ඉඩමක් වෙනත් කාර්යය සඳහා භාවිතයට අවසර දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ පිළිබඳ ලද මහජන විරෝධතා අනුව අවලංගු කර ඇති නමුත්, පනත ප්‍රකාරව 34(2) හි දක්වා ඇත්තේ කොමසාරිස් විසින් දක්වන කොන්දේසි උල්ලංඝනය කරන්නේ නම් එම ලිඛිත අවසරය අස්කර ගනු ලැබිය හැකි බවයි.

ඒ අනුව පැමිණිලිකරුට අවසරය ලබාදීමේදී දැක්වූ කොන්දේසි වන කණු මත ගොඩනැගිල්ල ඉදිකිරීම හා පළාත් පාලන ආයතන වෙතින් අනුමැතිය ලබා ගැනීම යන කාරණයන් ඒ ආකාරයෙන්ම ඉටු කර ඇති බව වගඋත්තර පාර්ශවයේ 2015.04.. දින රහිත ලිපියෙන් පිළිගෙන ඇති අතර, මෙම අවසරය අවලංගු කරනුයේ මහජන, රාජ්‍ය පාර්ශවය හා දේශපාලන අධිකාරියේ විරෝධතාව නිසා බව වගඋත්තර පාර්ශවය වාර්තාව මගින් පිළිගෙන ඇත. එසේම, ඒ පිළිබඳ පැවැත්වූ ත්‍රිපුද්ගල පරීක්ෂණ කමිටු වාර්තාවෙන් දක්වා ඇත්තේ අදාල කොන්දේසි අනුව කටයුතු කරන්නේ නම් ගැටළුවක් නොමැති බවයි.

එලෙස අදාල කොන්දේසි සපුරා තිබීම හා මහජන විරෝධතාවය නිසා පැවැත්වූ පරීක්ෂණයේදී නිර්දේශය අනුව පැමිණිලිකරු සම්බන්ධව වූ අවසරය අවලංගු කිරීමට හේතුවක් නොමැති බව අවධාරණය වේ.

ඒ අනුව එම සුජාත බලාපොරොත්තුව අනුව පැමිණිලිකරු එම අවසරය මත නිසියාකාරව මුදල් වියදම් කර ගොඩනැගිලි නැතිම් කර ඇති බවත්, ඒ තුළින් පැමිණිලිකරුට එය නිම කිරීමට නොහැකිවීම මත අගතිදායක තත්ත්වයක් ඇති වී ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව පනත ප්‍රකාරව අවසරය අවලංගු කිරීමට දක්වා ඇති හේතුවට පටහැනිව, මහජන විරෝධතාවය හා දේශපාලන අධිකාරියේ විරෝධතාවය මත අදාල අවසරය අවලංගු කිරීම තුළින් පැමිණිලිකරුට නීතියේ දක්වා ඇති රැකවරණය අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

උක්ත සමස්ථ කරුණු සැලකීමේදී පැමිණිලිකරුට නීතියේ සම රැකවරණය අහිමි වී ඇති බවට කරුණු අනාවරණය වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. වගඋත්තර පාර්ශවය විසින් විටින් විට නිකුත් කර ඇති අවසර පත හේතුවෙන් පැමිණිලිකරු සිය ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කර ඇති බැවින් අදාළ අවලංගු කළ අවසර පත බලාත්මක කර ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට පැමිණිලිකරු වෙත අවස්ථාව සැලසීමටත්,

02. වගඋත්තර පාර්ශවය ක්‍රියාත්මක වීමේ ගැටළුකාරීභාවය නිසා පැමිණිලිකරුට මෙම කාලය තුළ සිදු වූ ආර්ථිකමය හානිය සලකා පැමිණිලිකරු වෙත රු. 50,000/- ක වන්දි මුදලක් ගෙවීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කළයුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.10.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/ Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka